පාර්ලිමේන්තුවේ පුස්තකාලය
කොළඹ

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 17 දරන
# පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 අප්‍රේල් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 අප්‍රේල් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල ශත 20 යි | තැපැල් ගාස්තුව: ශත 35 යි

# 1980 අංක 17 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 අප්‍රේල් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 21/80.

**පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1980 අංක 17 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**383 වන අධිකාරයේ උපලේඛනයේ "අ" කොටස සංශෝධනය කිරීම.**

2. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පනතින් සංශෝධිත පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ උපලේඛනයෙහි "අ" කොටසේ 6 වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ කොටස මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"6අ. පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවෙන් (හැන්සාඩ්) යම් වචන හෝ ප්‍රකාශ ඉවත් කළ යුතු යයි කථානායකවරයා විසින් නියම කරනු ලැබීමෙන් පසු ඒ වචන හෝ ප්‍රකාශ හෝ ඇතුළත් පාර්ලිමේන්තුවේ යම් විවාදයක් හෝ එහි කටයුතු හෝ පිළිබඳ යම් වාර්තාවක් ඕනෑකමින්ම පළ කිරීම.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.